# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1815/29 - 2013 ජුනි මස 21 වැනි සිකුරාදා - 2013.06.21

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය : DS/UP/3/1/LAQ/DUNUKE.Ro/39/1.
ඔබේ අංකය : LD/05/2008/HW/444.

**අටබාගේ - දුනුකේඋල්ල මාර්ගයේ කි. මී. 3 + 100 සිට කි. මී. 3 + 900 දක්වා පුළුල් කිරීම සඳහා ඉඩම් අත්පත් කර ගැනීම**

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර :

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඳුකර ඉහළ කෝරළේ, මිල්ලගස්පිටිය ග්‍රාම නිලධාරී වසමේ පිහිටි මැනුම්පති විසින් මැන පිළියෙල කරන ලද කැඩැස්තර සිතියම් අංක 320232(3)03 දරන කැඩැස්තර සිතියමේ කැබලි අංක 122 හා කැඩැස්තර සිතියම් අංක 320114(1)2 දරන කැඩැස්තර සිතියමේ කැබැලි අංක 105 ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.1665 ක් වන කිරිවනාගොඩ වත්ත හා මිල්ලගස්පිටිය වත්ත නැමැති ඉඩම් කැබැලි දෙක.

| අනු. අංකය | කැඩස්තර සිතියම් අංකය | කැබැලි අංකය | ඉඩමේ නම | ප්‍රමාණය (හෙක්.) | හිමිකම් කියන අයගේ විස්තර |
|---|---|---|---|---|---|
| 01 | 320232(3)3 | 122 | කිරිවනාගොඩ-වත්ත | 0.0653 | විජේසිංහ බණ්ඩාර මහතා දුනුකේඋල්ල, අටබාගේ. |
| 02 | 320114(1)2 | 105 | මිල්ලගස්පිටිය වත්ත | 0.1012 | ඒ.පී.විජේසේකර මහතා, මිල්ලගස්පිටිය, අටබාගේ |

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2013 සැප්තැම්බර් මස 02 වැනි දින පූ. භා. 09.30 ට උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2013 අගෝස්තු මස 26 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

ටී. ගාමිණී මුණසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
උඩපළාත කොට්ඨාසය,
ගම්පොල.

2013 ජුනි මස 19 වැනි දින,
උඩපළාත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

07 - 166

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ යොමු අංකය: 3/1/2/8.
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ යොමු අංකය: LD/05/2006/WS/266.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මාවතගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ගන්දහය කෝරළේ, සුළු කොට්ඨාසයේ, ඇටගහවෙල ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් මැන සකස් කරන ලද 2013.05.27 දිනැති අංක කු 2293 දරන මූලික පිඹුරේ කැබලි අංක 1 වශයෙන් දැක්වෙන "අහස් පොකුණ වත්ත" නමැති ඉඩමෙන් මුළු ප්‍රමාණයෙන් හෙක්. 0.5894 ක් පමණ වන පහත මායිම් තුළ පිහිටි ඉඩම් කොටස.

**1. කැබලි අංක 1 ; ඉඩමේ නම : අහස් පොකුණ වත්ත ; ප්‍රමාණය: හෙක්. 0.5894**

**මායිම් :**

*උතුරට* : දැදුරු ඔය;
*නැගෙනහිරට* : කු 574 වැනි මූලික පිඹුරේ 1 වැනි බිම් කැබැල්ල;
*දකුණට* : කු 574 වැනි මූලික පිඹුරේ 1 වැනි බිම් කැබැල්ල;
*බටහිරට* : කු 1286 වැනි මූලික පිඹුරේ 37 සහ 38 වැනි බිම් කැබලි (ප්‍රාදේශීය සභා මාර්ගය)

*හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය :*

වයි. එම්. අනුර ලාල්සිරි මහතා, මොලතැන්න, පිළිමතලාව.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2013 සැප්තැම්බර් මස 23 වැනි දින පෙ. ව. 10.00 ට මාවතගම, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2013 සැප්තැම්බර් මස 16 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය. හිමිකම් කීම පිළිබඳ ඔප්පු ආදිය පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

ඊ. එම්. එම්. එස්. ඒකනායක,
ප්‍රාදේශීය ලේකම්,
මාවතගම.

2013 ජූනි මස 18 වැනි දින,
මාවතගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
කුරුණෑගල.

07 - 167

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.